# ඉතිහාසය

## 13 ශ්‍රේණිය



## 13.1 දහසය වැනි සියවසේ සිට දහ අට වැනි සියවස තෙක් ශ්‍රී ලංකාව

දර්ශනපති
එෂාන් ඉමල්ක විජයරත්න

ගුරුගෙදර - උසස් පෙළ ඉතිහාසය
ජාතික අධ්‍යාපන ආයතනය

# හැඳින්වීම

- දහසය වන සියවසේ දී ශ්‍රී ලංකාවේ ප්‍රධාන පාලන ඒකක 3ක් පැවතීම

1. කෝට්ටේ රාජධානිය
2. මහනුවර රාජධානිය
3. යාපනය රාජධානිය

# 13 ශ්‍රේණිය - ඉතිහාසය

## දහසය වැනි සියවසේ සිට දහඅට වැනි සියවස තෙක් ශ්‍රී ලංකාව



- ආරම්භයේ දී කෝට්ටේ රාජධානිය ප්‍රබලව පැවතීම
- අනතුරුව මහනුවර රාජධානිය ප්‍රබලව පැවතීම
- මහනුවර රාජධානියේ ආරම්භයේ සිට එහි බිඳ වැටීම දක්වා අවධානය යොමු කිරීම

- මහනුවර රාජධානියේ දේශපාලන, ආර්ථික හා සමාජ සංස්කෘතික තත්ත්වයන් පිළිබඳ අවධානය යොමු කිරීම
- දහසය වන සියවසේ දී ශ්‍රී ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශ පෘතුගීසි පාලනයට නතු වීම
- පෘතුගීසින් කෝට්ටේ, සීතාවක හා යාපනය රාජ්‍යයන් යටත් කර ගැනීම

- අනතුරුව ලන්දේසීන් ශ්‍රී ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශ යටත් කර ගැනීම
- පෘතුගීසීන් හා ලන්දේසීන් උඩරට රාජධානිය තම අණසකට නතු කර ගැනීමට උත්සාහ දැරීම
- උඩරට පාලකයන් එම ප්‍රයත්නයන් ව්‍යර්ථ කිරීම
- පෘතුගීසීන් හා ලන්දේසින් ශ්‍රී ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශවල දේශපාලන, ආර්ථික හා සංස්කෘතික වෙනස්කම් සිදු කිරීම

# මහනුවර රාජධානියේ ආරම්භය

- අනුරාධපුර අවධියේ දී මහනුවර ප්‍රදේශය කඳුරට යන අර්ථයෙන් මලය මණ්ඩලය, මලය දේශය හා මලයාණ්ඩු ලෙස හැඳින්වීම
- අනුරාධපුර පාලකයන්ගේ ආරක්ෂිත මධ්‍යස්ථානයක් ලෙස මහනුවර භාවිත වීම
- දාහතරවැනි සියවසේ දී පමණ සිට ගම්පොළ හා රයිගම පැවති පාලන ඒකක පිහිටි මධ්‍යස්ථාන එකිනෙකින් වෙන්කොට හඳුනාගැනීමට "උඩරට" හා "පහතරට" යන යෙදුම් භාවිත වීම

- සෙංකඩගල, ශ්‍රී වර්ධනපුර, සිරිවද්දනපුර හා සෙංකඩගල යන නාමයන්ගෙන් මහනුවර හැඳින්වීම
- මහනුවර රාජධානිය "කන්ද උඩරට" රාජ්‍යය ලෙස ද, "කන්ද උඩරට පස්රට" යනුවෙන් ද හැඳින් වූ බව
- පස්රට යනු උඩුනුවර, යටිනුවර, දුම්බර, හේවාහැට සහ හාරිස්පත්තුව බව

- කන්ද උඩරට රාජධානියේ අගනුවර මහනුවර වීම හා එය ස්වාභාවික ආරක්ෂිත ස්ථානයක් වීම

- තුන් පසකින් මහවැලි ගඟින් වට වී ඇති මහනුවර වටා බලන, හන්තාන, හුන්නස්ගිරිය යන කඳු වැටි පිහිටීම සහ බලන, ගලගෙදර හා බලකඩුව යන දුර්ග මාර්ග හරහා මහනුවරට පිවිසීමට සිදුවීම




## දහසය වැනි සියවසේ සිට දහඅට වැනි සියවස තෙක් ශ්‍රී ලංකාව




13 ශ්‍රේණිය - ඉතිහාසය

දහසය වැනි සියවසේ සිට දහඅට වැනි සියවස තෙක් ශ්‍රී ලංකාව



13 ශ්‍රේණිය - ඉතිහාසය

දහසය වැනි සියවසේ සිට දහඅට වැනි සියවස තෙක් ශ්‍රී ලංකාව





# ඓතිහාසික පසුබිම

- කෝට්ටේ VI වන පරාක්‍රමබාහු රජු (ක්‍රි.ව. 1415 - 1467) දවස මහනුවර රාජධානියට අයත් ප්‍රදේශ කෝට්ටේ රාජ්‍යයට යටත්ව පැවතීම
- ජෝතිය නම් සිටුවරයෙක් උඩරට ප්‍රදේශවල මෙකල කැරලි ඇතිකළ බැවින් VI වන පරාක්‍රමබාහු රජු අම්බුළුගල කුමරු යවා කැරලි මර්දනය කිරීම

- VI වන පරාක්‍රමබාහුගේ රාජ්‍ය කාලය අවසාන කාලයේ වික්‍රමබාහු කුමරු 1463 දී මාතලේ ප්‍රදේශයේ කැරැල්ලක් ඇති කොට මහනුවරට පැමිණි අතර ඔහුගේ අවනත භාවය ලබා ගැනීම

- ක්‍රි.ව. 1469 දී සේනාසම්මත වික්‍රමබාහු මුල් වරට මහනුවර රාජ්‍යය ස්වාධීන රාජ්‍යයක් ලෙස ආරම්භ කිරීම

- සේනාසම්මත වික්‍රමබාහු රජු මහනුවර රාජධානිය පිහිට වන අවස්ථාව වන විට අයත් වූ ප්‍රදේශ ලෙස සිදුරුවාණ, ගම්පොළ, දෙනුවර (උඩුනුවර, යටිනුවර), මාතලේ, පන්සිය පත්තුව, ඌව හඳුනා ගැනීම

- මහනුවර රාජධානිය සෞම්‍ය දේශගුණයක් සහ සරුසාර භූමියක් සහිත කලාපයක් වීම

# මහනුවර රාජධානියේ රාජනාමාවලිය

1. සේනාසම්මත වික්‍රමබාහු රජු (ක්‍රි.ව. 1469 - 1511)
2. ජයවීර බණ්ඩාර රජු (ක්‍රි.ව. 1511 - 1551)
3. කරල්ලියද්දේ බණ්ඩාර රජු (ක්‍රි.ව. 1551 - 1581)
4. පළමු වන රාජසිංහ රජු (ක්‍රි.ව. 1581 - 1592)
5. පළමු වන විමලධර්මසූරිය රජු (ක්‍රි.ව. 1592 - 1604)
6. සෙනරත් රජු (ක්‍රි.ව. 1604 - 1635)

7. දෙවන රාජසිංහ රජු (ක්‍රි.ව. 1635 - 1687)
8. දෙවන විමලධර්මසූරිය රජු (ක්‍රි.ව. 1687 - 1707)
9. ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රජු (ක්‍රි.ව. 1707 - 1739)
10. ශ්‍රී විජය රාජසිංහ රජු (ක්‍රි.ව. 1739 - 1747)
11. කීර්ති ශ්‍රී රාජසිංහ රජු (ක්‍රි.ව. 1747 - 1781)
12. රාජාධි රාජසිංහ රජු (ක්‍රි.ව. 1781 - 1798)
13. ශ්‍රී වික්‍රම රාජසිංහ රජු (ක්‍රි.ව. 1798 - 1815)

# සේනා සම්මත වික්‍රමබාහු
# (ක්‍රි.ව.1469 - 1511)

- කෝට්ටේ VI වන බුවනෙකබාහු රජු දවස ඇති වූ සිංහල සංගය මර්දනයට අම්බුළුගල කුමරු සේනාව සතර කෝරළයට රැගෙන යෑම නිසා 1472 - 1474 අතර කාලයේ සේනාසම්මත වික්‍රමබාහු රජු සතර කෝරළේ ජන ප්‍රධානීන් පක්ෂපාත කර ගැනීම

- පෘතුගීසින් ශ්‍රී ලංකාවට පැමිණෙන අවධියේ උඩරට පාලකයා මොහු වීම
- කෝට්ටේ VIII වන වීර පරාක්‍රමබාහු රජු උඩරට ප්‍රදේශ කෝට්ටේ රාජ්‍යය යටතට ගැනීමට සතර කෝරළය හරහා ගඩලාදෙණිය දක්වා ආක්‍රමණයක් කර 1494 දී ගඩලාදෙණි ලිපිය පිහිටවීම

# ජයවීර බණ්ඩාර (ක්‍රි.ව. 1511 - 1551)

- සේනාසම්මත වික්‍රමබාහුගේ පුත්‍රයා වීම
- සිතාවක පාලක මායාදුන්නේ රජුගේ මිතුරෙකු වීම
- කෝට්ටේ පාලක VI වන විජයබාහු රජුට විරුද්ධව 1521 දී රජ වාසලෙහි කැරැල්ලක් ඇතිවීම
- විජයබා කොල්ලය නම් මෙම කැරැල්ලට ජයවීර බණ්ඩාර රජුගේ ආධාර ලැබීම

- විජයබාහු රජු ඝාතනය කර පුතුන් තිදෙනා කෝට්ටේ රාජ්‍ය කොටස් තුනකට බෙදා ගැනීම

    1. කෝට්ටේ - VII වන බුවනෙකබාහු
    2. රයිගම - රයිගම් බණ්ඩාර
    3. සීතාවක - මායාදුන්න

- රයිගම් බණ්ඩාර 1538 දී මියයෑමත් සමඟ රයිගම රාජ්‍යය මායාදුන්න රජු සීතාවකට ඈඳාගැනීම
- කෝට්ටේ බුවනෙකබාහු රජු හා සීතාවක මායාදුන්නේ රජු අතර 1521 සිට 1551 අතර සටන් පැවතීම

# කරල්ලියද්දේ බණ්ඩාර (1551 - 1581)

- ජයවීර බණ්ඩාර රජුගේ පුත්‍රයා වීම
- පෘතුගීසින් හා මිත්‍ර ප්‍රතිපත්තියක් රැගෙන යාම
- කෝට්ටේ රාජ්‍යයේ බුවනෙකබාහුගෙන් පසු රජුගේ මුණුබුරු ධර්මපාල 1551 දී රාජ්‍යත්වයට පත්වීම
- කරල්ලියද්දේ රජු පෘතුගීසි ආරක්ෂාව ලබමින් සිටි කෝට්ටේ ධර්මපාල සමඟ සබඳතා පැවැත්වීම හා රජුගේ වැඩමහලු දියණිය ධර්මපාල රජු හා විවාහ වී සිටීම

- සීතාවක මායාදුන්න රජු හා ඔහු පුත් රාජසිංහ කුමරු ධර්මපාලගේ නාමයෙන් වූ කෝට්ටේ පෘතුගීසි බලය කොළඹ අවට ප්‍රදේශයට සීමා කිරීම
- කරල්ලියද්දේ බණ්ඩාරගේ ප්‍රතිපත්ති මත උඩරට රදල ප්‍රධානීන් අමනාප වීම හා ඔවුන් සීතාවක 1 වන රාජසිංහ රජුට සහය වීම
- උඩරට පේරාදෙණියේ වීරසුන්දර බණ්ඩාර නම් ප්‍රභූවරයාගේ උපකාරයෙන් 1582 දී සීතාවක රාජසිංහ උඩරට ආක්‍රමණය කිරීම

- කරල්ලියද්දේ බණ්ඩාර කතෝලික ආගම වැළඳ ගැනීම
- කරල්ලියද්දේ බණ්ඩාර රජු ඔහුගේ දියණිය වූ කුසුමාසන දේවිය හා බෑණා වූ යමසිංහ බණ්ඩාර සමඟ මන්නාරම් තොටේ පෘතුගීසීන් වෙත පලා යාම

# 1 වන රාජසිංහ රජු (ක්‍රි.ව. 1581 -1591)

- උඩරට යටත් කරගත් රාජසිංහ රජු සීතාවක සිට උඩරට ප්‍රදේශ පාලනය කිරීම
- කන්ද උඩරට පාලන කටයුතු රාජසිංහ රජු විසින් වීරසුන්දර බණ්ඩාරට පැවරීම
- සීතාවක රාජසිංහ රජු භක්තිය වැළඳ ගැනීම හා ඊට අනුග්‍රහ දැක්වීම නිසා උඩරට රදල ප්‍රධානීන් කැරලි ගැසීම

- මෙම කැරලි පේරාදෙණියේ වීරසුන්දර බණ්ඩාර මෙහෙයවීම
- රාජසිංහ රජු කූට උපායකින් වීරසුන්දර බණ්ඩාරට වලගම වට්ටාරම දෙන බව පවසා ගොලෑබොක්කේ බොරු වළක වට්ටා මරා දැමීම
- වලගම වට්ටාරම යන්නෙහි සැඟවුණු අර්ථය බොරු වළ කපා දෙන බව
- උඩරට පාලනය නිකපිටියේ බණ්ඩාරට ලබාදීම
- වීරසුන්දර බණ්ඩාරගේ පුත් කොනප්පු බණ්ඩාර කොළඹට පලායාම

- පෘතුගීසීන් හා එක්ව කතෝලික ආගම වැළඳගත් කොනප්පු බණ්ඩාර ඔස්ට්‍රියාවේ දොන් ජුවන් නමින් බෞතීස්ම ලැබීම
- කෝට්ටේ හා මහනුවර රජුන්ගේ ආධිපත්‍යයට යටත් ප්‍රදේශ රාජසිංහ යටතට පත්වීම හා කොළඹට එරෙහිව රජුගේ මුළු බලයම යෙදවීම
- රජුගේ අවධානය වෙනතක යෙදවීමට පෘතුගීසීන් යමසිංහ බණ්ඩාර රජ කරවීමේ අදහසින් කොනප්පු බණ්ඩාර යටතේ උඩරටට විශේෂ හමුදාවක් යැවීම
- යමසිංහ බණ්ඩාර සිංහාසනාරූඪව නොබෝ කලකින් මිය යාම

# 1 වන විමලධර්මසූරිය (1592 - 1604)


- පෘතුගීසි හමුදාව පලවාහැර කොනප්පු බණ්ඩාර, 1 වන විමලධර්මසූරිය නමින් උඩරට සිහසුනට පත්වීම
- විමලධර්මසූරිය රජුගෙන් ආරම්භ වන්නේ උඩරට නව රාජවංශයක් වීම
- විමලධර්මසූරිය රාජ්‍ය සමයේ වැදගත්කම අංශ 3කට බෙදා දැක්විය හැකි වීම

1. දේශපාලන සේවාව
2. ආගමික සේවාව
3. ආර්ථික සේවාව

# දේශපාලන සේවාව

- රජුට සතුරන් දෙකොටසකට මුහුණ දීමට සිදුවීම
    1. සීතාවක රාජසිංහ සමඟ ඇති වූ ගැටුම්
    2. පෘතුගීසීන් සමඟ ඇති වූ ගැටුම්
- සීතාවක රාජසිංහ 1592 දී 1 වන විමලධර්මසූරියට එරෙහිව උඩරට රාජ්‍ය ආක්‍රමණය කිරීම
- බලන දී ඇති වූ සටනින් වයෝවෘද්ධ වියේ සිටි සීතාවක රාජසිංහ පරාජයට පත්වීම

- පරාජිතව පසු බසින විට රුවන්වැල්ල අසල පෙතන්ගොඩ උයනේ දී රාජසිංහ රජු උණකටුවක් ඇනී විෂවීමෙන් මිය යාම



- උඩරට සිහසුනෙන් නෙරපන ලද රජුගේ දියණිය වන කුසුමාසන දේවිය සිහසුනට පත් කිරීමට 1594 දී පෘතුගීසින් උඩරටට හමුදාවක් යැවීම
- පෘතුගීසින් කපිතාන් ජනරාල් පේරෝ ලෝපේස් ද සූසා යටතේ ආක්‍රමණය මෙහෙයවීම
- දන්තුරේ දී ඇති වූ සටනින් පෘතුගීසින් පරාජය කළ විමලධර්මසූරිය විසින් රජ කුමරිය වූ කුසුමාසන දේවිය සරණපාවාගෙන උඩරට සිහසුනට ඇති අයිතිය තහවුරු කර ගැනීම

# 13 ශ්‍රේණිය - ඉතිහාසය
## දහසය වැනි සියවසේ සිට දහඅට වැනි සියවස තෙක් ශ්‍රී ලංකාව



- පෘතුගීසීන් විසින් "කන්ද උඩරට ද්‍රෝහියා" ලෙස විමලධර්මසූරිය රජු හැඳින්වීම
- එතෙක් සිහසුනට අයිතියක් නොතිබූ විමලධර්මසූරිය, පෘතුගීසින් 800 දෙනෙකු පරදවා අසිපතේ බලයෙන් කුසුමාසන දේවිය දිනාගත් බව සඳහන් වීම
- 1593 දී රාජසිංහ මිය ගිය පසු සීතාවක රාජ්‍යයේ කොටසක් පෘතුගීසීන් ද, ඉතිරි කොටස උඩරට රාජ්‍යයට ද, ඈඳා ගැනීම

- කපිතාන් ජනරාල් දොන් ජේරනිමෝද අසවේදු ගෝවේන් ආධාර ලබා ගෙන 1602 වර්ෂයේ අග භාගයේ දී පෘතුගීසි, සිංහල හා ඉන්දියානු භටයන්ගෙන් සමන්විත ඒකාබද්ධ හමුදාවක් රැගෙන උඩරට ආක්‍රමණය කිරීම

- බලන දී ඇති වූ සටනින් බලන කොටුව අල්ලා ගත්ත ද අසවේදු සමඟ ගිය සිංහල සේනා උඩරට විමලධර්මසූරිය රජුගේ සේනාවට එක් වීමෙන් පරාජිතව කොළඹට පසු බැසීම

# 13 ශ්‍රේණිය - ඉතිහාසය
## දහසය වැනි සියවසේ සිට දහඅට වැනි සියවස තෙක් ශ්‍රී ලංකාව



- කන්ද උඩ පස්රටට සීමා වූ මහනුවර රාජ්‍ය තව දුරටත් පුළුල් කිරීම
- කන්ද උඩරටින් පලවා හරින ලද පෘතුගීසින් මුහුදු බඩ ප්‍රදේශවලින් පලවා හැරීමට උත්සාහ ගැනීම හා එම ප්‍රයත්නය අසාර්ථක වීම
- පෘතුගීසීන් මුහුදු බඩ ප්‍රදේශයට සීමා කර තැබීම
- දකුණු ඉන්දියාවේ මදුරෙයි හා මයිලපූර් ප්‍රාදේශීය රාජ්‍යයන්ගෙන් වඩුග කුලී හමුදා ලබාගෙන උඩරට ආරක්ෂාව තර කිරීම

# විදේශ සබඳතා

- පෘතුගීසින් පලවා හැරීම අරමුණු කරගෙන ලන්දේසින් සමඟ සබඳතා පවත්වා ගැනීම
- ක්‍රි.ව. 1602 දී මඩකලපුවට ළඟා වූ ලන්දේසි නැව් කණ්ඩායමක කපිතාන් වූ ස්පීල් බර්ජන් රජු හා සාකච්ඡා කිරීමට රජවාසලට පැමිණීම
- ශ්‍රී ලංකාවේ තමන්ට වෙළෙඳාම් කිරීමට ඉඩ ලබාදෙන්නේ නම් පෘතුගීසින් ශ්‍රී ලංකාවෙන් නෙරපා දැමීමට උපකාර කරන බවට ඔරේන්ජ්හි විලියම් රජු විසින් එවන ලද සංදේශය රජුට පිරිනැමීම



- මෙම දූත ගමන අසාර්ථක වීම
- ඉන් තුන් මසකට පසු සීබෝල්ට් ද වාර්ට් නම් ලන්දේසි නැවියා රජු මුණ ගැසීම
- මඩකලපුවේ නැංගුරම්ලා තිබූ පෘතුගීසි නැව් අල්ලා ගත්ත ද ඒවා රජු වෙත ලන්දේසින් ලබා නොදීම

- මේ පිළිබඳ සාකච්ඡාවක දී රජුට අගෞරව වන සේ හැසිරුණු වාර්ට් ඇතුළු 50 දෙනෙකු රාජපුරුෂයන් විසින් විනාශ කිරීම

- විමලධර්මසූරිය රජු හා ලන්දේසින් අතර සබඳතා බිඳ වැටීම

- 1604 දී උණ රෝගයකින් රජු මිය යාම

# ආගමික සේවාව

- රෝමානු කතෝලික ආගම අතහැර කොනප්පු බණ්ඩාර බුදු දහම වැලඳ ගැනීම
- විමලධර්මසූරිය නම් බෞද්ධ නමක් භාවිත කිරීම
- සීතාවක රජවරු පෘතුගීසින්ගෙන් ආරක්ෂා කර ගැනීමට සබරගමුවේ දෙල්ගමු විහාරයේ කුරහන් ගලක සඟවා තිබූ දළදා වහන්සේ මහනුවරට වැඩම කරවා දෙමහල් පහයක් ලෙස දළදා මාළිගය ඉදිකිරීම

# දහසය වැනි සියවසේ සිට දහඅට වැනි සියවස තෙක් ශ්‍රී ලංකාව



- රක්ඛංග දේශයෙන් උපසම්පදාලාභී භික්ෂූන් වැඩම කරවා මහවැලි ගඟේ ගැටඹේ තොටේ දී උපසම්පදාව යළි ඇති කිරීම
- ලංකාතිලක විහාරය, රිදී විහාරය, ගඩලාදෙණිය ඇතුළු පැරණි වෙහෙර විහාර ප්‍රතිසංස්කරණය කිරීම
- බදුල්ලේ කතරගම දේවාලයට ගම්වර ප්‍රදානය කිරීම

# ආර්ථික සේවාව

- වී ගොවිතැන දියුණු කිරීම
- කපු වගාව දියුණු කිරීමට අනුබල ලබා දීම
- කොත්මලේ, වලපනේ ප්‍රදේශවල යකඩ හා වානේ කර්මාන්තය දියුණු කිරීම
- උඩරට රාජ්‍යය ආශ්‍රිත වෙඩි ලුණු කර්මාන්තය දියුණු කිරීම

# සාරාංශය

